
sinhalaebooks.com



# යසෝමා- සුමතිපාල ජෝතිපාල

සතිඅග අරුණ පුවත්පතේ පළවූ කෙටිකතාවක් පාඨකයන්ගේ කියවීමේ පහසුව උදෙසා pdf ලෙස සකසන ලද්දේ sinhalaebooks.com විසිනි.

sinhalaebooks.com

යසෝමා උළුඅස්සට හේත්තු වී වට පිට බැලුවේ 'දඩාස්' ගා ඇසුණ සද්දෙත් සමග කූඩුවේ සිටි බල්ලා අතෝරක් නැතුව බුරන්නට පටන් ගත් නිසාය. බලු කූඩුවේ තහඩු වහළට කුරෝලු වී ගිය තැඹිලි ඇට්ටියක් වැටී ඇති බව ඇයට වැටුණේ ගේ මිදුලේ වැට මායිම ආසන්නයේ ඇති කොස් ගස පාමුල වතුර බේරෙන ඇට්ටිය දැක ගැනීමෙන් අනතුරුවය. නැගුණු ඒ සද්දෙට දඩාවතේ යන බලු රංචුවක් බුර බුරා පාර දිගේ ඒ මේ අත දිව ගියහ. යසෝමා මිදුලට බැස බලු කූඩුව දෙසට ඇවිද ගියාය.

මිදුලත් වැට මායිමත් අතර කොටසේ සිටුවා ඇති කොස් ගහේ පෙර දින රාත්‍රියේ ලැග උන් වවුළන් විසින් හපකරණ ලද වැළමදළු මිදුල පුරා විසිරී ඇත. මදුළු අතර වසා උන් කෝදුරුවන් රැන් පිටින් ඇයගේ පය ගැටෙන හඬට බිය වී පියඹා ගියෝය. ලාවුළු ඇටවත් කොස් ඇට හප කරන ලද මදුළු අතරින් මතුවී ඇත. කොස් ගහට හේත්තු කර තිබූ ඉදල්කොටය අතට ගත් යසෝමා එහි තුඩු අගින් වැළමදුළු එහා මෙහා කරමින් කොස් ඇට තෝරන්නට වූවාය.

කඩුල්ල අසල වැට මායිමේ ඇති රුස්ස අරලිය ගසේ මල් වියනක් සේ පිපි ඇත. ඉන් පැතිරී ගිය සුවඳ සුළඟට මුසුව නාස්පුඩු අතරින් ගත පුරා දිවෙන්නේ මිදුල පුරා විසිරී ඇති වැළ මදුළුවලින් හමන දුගඳ පලවා හරිමිනි. එක තැනකට එක් කළ කොස් ඇට පෝර උරයක දමා තුනී කර හිරුඑළිය වැටී ඇති කොස්ගහ අද්දරින් තැබූ යසෝමා බලු කූඩුවේ දොර විවෘත කර බල්ලව එළියට දැම්මේ කන්දෙකට කරදරයක් වූ නිසාය. පිටතට පැමිණි ඌ ඇගේ දෙපතුල් ඉවකරමින්

sinhalaebooks.com

අන්දර වැට ළඟ දිරාපත් වී ඇති ලෑලි බංකුව මතට පැන පාරේ බුර බුරා එහේ මෙහේ දුවන බල්ලන් දෙස විමසිල්ලෙන් බලා සිටියේය.

අවුරුදු තිහ හතළිහකට පමණ පෙර යසෝමාගේ නිවස පිහිටා තිබූ ඉඩමේ අරලිය ගසට මදක් ඈතට වන්නට විශාල සෙක්කුවක් සවිකර තිබුණේය. ඇගේ පියා හරමානිස් සෙක්කුව උපයෝගී කරගනිමින් තෙල් සිඳ ගමේ මිනිසුන්ට විකුණා මුදල් උපයා ගත්තේය. ඒ දිනවල ගමේ උදවිය යසෝමාගේ ගෙදරට පැමිණ සිඳින ලද තෙල් මිලදී ගත්හ. තනි කළුගලෙන් නිමවා ඇති සෙක්කුව මැද විශාල කුහරයකි. කුහරය මැදට කෑලි කපන ලද කොප්පරා දමා සවිමත් දැවෙන් තැනූ රවුම් මුහුණතක් සහිත කොටයක් ඒ තුළ බහා ගොන් බානක් ආධාරයෙන් තෙල් සිඳ ගනියි. මෙය විශාල ගල් වංගෙඩියකට සමාන කළ හැකි කෞතුක භාණ්ඩයකි.

සිරිපාල සහ යසෝමා විවාහ වූ අලුත සෙක්කුව ආසන්නයේ ඇති ගල් බංකුවේ වාඩි වී සතුටු සාමිචියේ යෙදුණු අතර ඇය විසින් සෙක්කුව පිළිබඳ අවබෝධයක් ඔහුට ලබාදුන්නාය. සිරිපාල කැමැත්තෙන් සෙක්කුවේ ක්‍රියාකාරීත්වය යසෝමාගෙන් දැන උගත්තේය. කාලයාගේ ඇවෑමෙන් සෙක්කුවෙන් ප්‍රයෝජන නොගත් හරමානිස් එය තම්බි මිනිසෙකුට විකිණීම සඳහා කටයුතු කළේය. ඒ බව දැනගත් සිරිපාල සෙක්කුව තමාට ලබා දෙන ලෙසත් ඒ සඳහා ගෙවීමක් කරන බවත් පියාට දැනුම් දුන්නේය.

sinhalaebooks.com

**"තාත්තේ....! සෙක්කුව තම්බියට විකුණන්න ඕන නෑ...මම සල්ලිවලට ගන්නම්.. මට දෙන්න.."**

**"සෙක්කුවෙන් වැඩ ගන්න උඹට තේරෙන්නේ නෑ සිරිපාල. මම ඒක තම්බියට දෙන්න පොරොන්දු වෙලා ඉවරයි."**

**"පොරොන්දු වුණාට වික්කේ නෑනේ..."**

**"වචනේ වචනෙ විදිහට තියෙන්න එපැයි.."**

ඔහු කීවේ ගැඹුරු ස්වරයෙනි.

හරමානිස් සෙක්කුව තම්බි මිනිසාට විකිණීම පිළිබඳව සිරිපාල දැඩි කනස්සල්ලෙන් පසුවූවේය. පරණ බඩු එකතු කරන්නෙකු වූ තම්බි මිනිසා හරමානිස්ගෙන් කුණුකොල්ලයට ගෙන වැඩි මිලකට කෞතුක භාණ්ඩ එකතු කරන්නෙකුට විකුණා දමන්නට ඇති බව සිරිපාල යසෝමා දැනුවත් කළේය. එවැනි සෙක්කුවක් තමා කිසිදිනෙක දැක නැති බවත් එහි වටිනාකම මිලෙන් අධික බවත් ඔහු ඇය සමග පැවැසුවේය. කෙසේ වෙතත් සිරිපාලගේ සිත සෙක්කුව මත්තෙම නැහෙන්නට විය.

**"අපරාදේ යසෝ..."**

**"මොනව කරන්නද සිරිපාල. අපේ තාත්තගේ හැටි ඔහෝම තමයි."**

මේ අතරවාරයේ ගැබිනියක්ව සිටි යසෝමා කුලුඳුල් දරු උපත සිදු කළාය. සිරිපාල සෙක්කුව ගැන නිතර දොඩවන්නට පටන් ගත්තේය. හරමානිස් හා

sinhalaebooks.com

සිරිපාල සෙක්කුව මුල් කරගෙන අඩදබර ඇති කර ගත්හ. නිතර දබර කරගැනීම ඇයට මහත් කරදරයක් විය. තම දරුපැටියාද කිහිලි ගන්වාගෙන දබර බේරීම සඳහා මැදට පැන්නාය. සෙක්කුව ගැනම කල්පනා කරමින් සිටි සිරිපාල සිහිමඳ ගතියෙන් පෙළුණේය. සරණපාලට වයස අවුරුදු තුනක් වෙද්දී පපුවේ හටගත් කිසියම් රෝගී තත්ත්වයක් උත්සන්න වීමෙන් සිරිපාල නිදි පැදුරේම අවසන් හුස්ම හෙළුවේය.

හරමානිස් එවැනි අකල් මරණයක් කිසිසේත් බලාපොරොත්තු නොවීය. සිරිපාල මියගියේ තමා සිතා මතාම කළ අනුවණ ක්‍රියාව නිසා නොවේදැයි ඔහු කල්පනා කළේය. සිරිපාල සෙක්කුව නිසා මේ තරම් චිත්ත පීඩාවකට පත්වේයැයි ඔහු නොසිතුවේය. තම එකම දියණියට සැමියත් හයක් හතරක් නොදන්නා දරු පැටියට පියාත් අහිමි වූයේ තමාගේ වරදින් බවද හරමානිස්ට සිතිනි. පුංචි සරණපාලට යන්තම් අවුරුදු පහ සම්පූර්ණ වෙද්දී යසෝමාගේ පියා නිවසින් අතුරුදන් විය. තම පුතා සමග යසෝමා නිවසේ තනිවිය.

අඩුපාඩු කොපමණ තිබුණත් සිරිපාලගේ පැන්ෂන් පඩියෙන් යසෝමා දරුවාට අගහිඟකම් නොපෙන්වා නිසි අධ්‍යාපනය ලබාදීමට කටයුතු කළාය. පාසලේදී හොඳින් අධ්‍යාපනය හැදෑරූ සරණපාල විභාගවලින් ඉහළින් සමත් වීමට තරම් දක්ෂයෙක් වූවේය. එනිසාම ඔහු විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා රජයේ උසස් රැකියාවකට උරුමකම් කීමට තරම් වාසනාවන්තයෙකු විය. තමා හැදී වැඩුණු මවගේ නිවසේ සිට රැකියාවට ගිය සරණපාල ටික දිනකින් අගනුවරින් නවීන

sinhalaebooks.com

පන්නයේ නිවසක් සහ සුඛෝ්පභෝගී මෝටර් රථයක් මිලදී ගෙන තරුණ බිරිඳ සමග එහි පදිංචියට ගියේය.

යසෝමා නිවසේ තනි වූවාය.

සති අන්තයේ දිනෙක හිමිදිරියේ සරණපාල බිරිඳ නිර්මලා සිඟිති දියණියද කැටුව මෝටර් රථයෙන් ගෙදර පැමිණියේය. යසෝමා රටක් රාජ්‍යයක් හිමිවූවා සේ දැනුණ සතුට දෑස් අගින් පිට කළාය. නිවසින් පිටව නගරයේ පදිංචියට ගොස් අවුරුදු දෙකකට පමණ පසුව සිය මෑණියන් දැකීමට පැමිණීම සරණපාලද සතුටට පත්වූවේය. මව වැලඳගත් ඔහුගේ දෑසින් පිටවූ කඳුළු ඇයගේ මුහුණ තෙමන්නට සමත් විය. නිර්මලා යසෝමාගේ දෙපතුල් අල්ලා වැන්දාය.

**"උඹලා ආපු එක කොච්චර එකක්ද පුතේ. වළපයයි ගොඩපයයි ඉන්න මට උඹලගේ මුහුණ දැක ගන්නකම් ඉස්පාසුවක් නැතුවයි හිටියේ. මම දන්නවා උඹලා කවදහරි දවසක මාව බලන්න එන බව. දැන්නම් මට මැරුණත් කමක් නෑ."**

යසෝමා සාරිපොටෙන් කඳුළු පිසදා ගත්තාය.

sinhalaebooks.com

“රාජකාරී වැඩයි දරුවගේ වැඩයි එක්ක එන්න වෙලාවක් නෑ අම්මේ. අනික නිර්මලා රස්සාවට යන්නත් එපැයි. එන්න බැරි වුණේ ඒකයි. අපි ආවේ අම්මව ටික දවසකට අපේ ගෙදර එක්කගෙන යන්න. නේද නිර්මලා.”

“ඔව් අම්මේ…අපි දෙන්නම වැඩට ගියාම දරුවා විතරයි ගෙදර ඉන්නේ. පිට කෙනෙක් ගෙදර තියාගන්නවට වඩා අම්මා අපිත් එක්ක ඉන්නවනම් කොච්චර එකක්ද? නේද සරණේ.”

“මම කොහොමද බං මේ ගෙවල් දොරවල් වහලා දාලා එන්නේ. අනික මට ඕවැ ගිහිල්ලා පුරුද්දක් නෑ. මට මෙහෙම හොඳයි.”

“අම්මට එන්න බැරිනම් අපි බලකරන්නේ නෑ. අනික අම්මට ලෙඩක් දුකක් හැදුනම කවුද ඉන්නේ. කවුරුවත් දන්නෙත් නෑ. ඒකයි මම කිව්වේ..”

“ඒක නම් ඇත්ත තමයි පුතේ. ඒ වුණාට ගෙදර වැඩයි. ළමයි බලාගන්නයි මට දැන් හයියක් හත්තියක් නෑ බං.”

“මේ ඉඩකඩම් කවද හරි මටනේ. ඒ හින්දා ඉඩමයි ගේයි මට ලියලා දීලා අම්මා යං අපේ ගෙදර. ඔය කියන තරම් වැඩ අපේ ගෙදර නෑ.”

“උඹලා කියනවනම් ඉතින් එහෙමවත් කරමු.”

“ඒක හොඳයි අම්මේ..අපි මේ දේවල් අදම එකලාසයක් කරමු. නේද නිර්මලා..”

sinhalaebooks.com

**"ඔව් ඒක නම් ඇත්ත තමයි. තව දවසක් මොකටද. අදම මේ වැඩේ ඉවරයක් කරමු."**

සරණපාල ටවුමට ගොස් පෙරකදෝරුවෙක් සමග පැමිණියේය. අක්කරයක පමණ ඉඩම සහ නිවස සරණපාලගේ නමට පැවැරූ යසෝමා දිග සුසුමක් වා තලයට පා කර හැරියහ.

**"දැන් හරි අම්මේ.."** සිනහවෙන් මුව පුරවා ගත් නිර්මලා නැන්දණියගෙන් ඉඩමේ ඔප්පුව ඉල්ලා ගත්තාය.

**"මේවා ඉතින් උඹට උරුම දේවල්නේ පුතේ. අද ලිව්වත් හෙට ලිව්වත් මේ දේවල් කෙරෙන්න එපායැ."**

යසෝමා හිතේ ගුළිකර ගත් දරු සෙනෙහස දිගහැර පෑවාය.

**"අම්මේ...අපි ලබන සුමානේ අම්මව එක්කගෙන යන්න එනවා. ලෑස්තිවෙලා ඉන්න."**

රුපියල් පන්දහසක මුදල් නෝට්ටුවක් අතමිට මෙල වූ සරණපාල තම මවගේ දෙපා නැමද සමුගත්තේය.

**"බුදු සරණයි පුතේ උඹට"**

sinhalaebooks.com

යසෝමා රිය පෙනෙන තෙක් මානයේ දෑස් දල්වා බලා සිට ගෙතුළට වැදුනාය. පඩුපැහැ ගැන්වී ගිය සාරිපෝට පටලවාගෙන පසුදින සිරිපාලගේ පැන්ෂන් පඩිය ලබාගැනීම සඳහා යසෝමා තැපැල් කන්තෝරුව වෙත ගියාය. පැන්ෂන් පඩි ලබාගැනීම සඳහා එහි පැමිණි පිරිස් පෝලිම් ගැසී සිටියහ. යසෝමා සේපාලිකා ගහයට තිබූ ගල් බංකුව වෙත පැමිණ හිඳගත්තාය. ගසේ මල් පිරී ඇත. හමන සුවඳ කන්තෝරු භූමිය පුරා විහිදී යයි. තණ බිස්ස මතට වැටී ඇති පරමල් පයට පෑගී පොඩි වී තිබේ.

පැන්ෂන් පඩි ගැනීම සඳහා අත්වාරුවකින් පැමිණි පුද්ගලයෙක් හිඳ ගැනීමට තැනක් සොයමින් ඒ මේ අත ඇවිදිමින් සිටියේය. යසෝමා පෝලිම දෙසට නෙත් විවර කරන අතරතුර දුටු ඔහු පියරත්නට සමානකම් ඇති යැයි සිතුවාය. ඔහුගේ එක් පාදයක් වෙළුම් පටියකින් වැසී ඇත. එහෙත් පියරත්නට පාදයේ ආබාදයක් තිබූ බවක් යසෝමාට මතක නැත. ඇය ගල් බංකුවෙන් නැගිට ඔහු අසලට ගියාය. දෙයියනේ...මේ පියරත්න නේන්නම්.

**“පියරත්න!”**

යසෝමා පුදුමයෙන් ඔහු දෙස බලා සිටියාය. මීට අවුරුදු ගාණකට පෙර ඔහුගෙන් දිස් වූ ඒ පියකරු පෙනුම අතුරුදන්ව හඳුනාගත නොහැකි වෙනසකට පෙරළී ඇත. ජීවිතය ඔහොම තමයි. ඇයට සිතුනාය.

sinhalaebooks.com

**"මගේ කකුල රිදෙනවා. මට හිටගෙන ඉන්න අමාරුයි. අපි වාඩිවෙලා කතා කරමු යසෝ."**

ඔහු වේදනාව යටපත් කරගෙන කතා කරන බවක් ඇයට හැඟී ගියාය.

**"යමු....යමු...."** පියරත්නගේ අතින් අල්ලා ගත් යසෝමා ඔහු ගල් බංකුව මතින් හිඳුවා අත් වාරුව සේපාලිකා ගසට හේත්තු කළාය. පියරත්න හා යසෝමා පාසල් අවදියේ පෙම්වතුන් වූහ. දෙමව්පියන්ගේ තීන්දු තීරණවලට අනුව ඔවුනට වෙන්වීමට සිදුවිය. යසෝමා දෙමව්පියන්ගේ සතුට වෙනුවෙන් පියරත්න අමතක කර වාරිමාර්ගේ රැකියාව කළ සිරිපාල සමග විවාහ වූවාය. පියරත්න යසවතීගේ සැමියා විය.

**"ඉතින් කියන්න පියරත්න. ඔයා කොහෙද මෙහේ."**

**"මම ඉන්නේ මහළු නිවාසෙක"**

**"මොනවා....මහළු නිවාසෙක. කෝ දරුවෝ."**

**දරුවන්ට ඉඩකඩම් ලියලා දුන්නා. ටික කාලයක් දරුවෝ ළඟ හිටියා. කකුලේ අමාරුව හොඳ වෙන්නේ නැති බව දරුවන්ට තේරුණා. ඊට පස්සේ මාව මහළු නිවාසෙක නතර කළා."**

sinhalaebooks.com

“ඒක හරි කතාවක්නේ. දෙමව්පියෝ වයසට ගියාම දරුවෝ බලන්න එපායැ.”

“අපි එහෙම හිතුවට දරුවන්ට එහෙම හිතෙන් නැතුව ඇති.

“දරුවන්ට දේපළ ලියලා දුන්නට පස්සේ දෙමව්පියන්ව අසරණ කරන එක වැරදියි. ඒක හරි පව්කාර වැඩක්.”

යසෝමා කීවාය.

“කොච්චර කාලෙකට පස්සෙද අපි හමුවුණේ.”

“යසවතී අක්කා නැති වුණේ අනූවේ පෙබරවාරියේ. සිරිපාල නැති වුණේ මාර්තු අන්තිම වගේ. අවුරුදු හතළිකට විතර පස්සේ මගේ හිතේ ඔයාටත් දැන් අවුරුදු හැත්තෑ අටක් වෙනවනේ. මට හැත්තෑ පහක් වෙනවා.”

“මතකයි නේද..?”

“අමතක කරන්න පුළුවන්ද?”

“අපි දෙන්නම තනිවෙලා යසෝ.”

“වළපයයි ගොඩපයයි ඉන්න අපිට දැන් ඉතින් මොන තනියක්ද පියරත්න.”

“වෙන්වෙනන හිතාගෙන අපි ආදරේ කළේ නෑ යසෝ. මොනතරම් බලාපොරොත්තු තිබුණද අපිට ඒ කාලේ. අනාගතය ගැන සැලසුම් කරපු හැටි. දරු මල්ලෝ හදාගෙන පුංචි ගෙදරක ජීවත් වෙන්න පෙරුම් පිරුව හැටි. අපි ඒ දවස්වල කොයිතරම් හීන මැව්වද? ඔයාට මතකද මන්දා..?”

sinhalaebooks.com

"මොකද මතක නැත්තේ. කාලයත් එක්ක අපේ ඒ හැම බලාපොරොත්තුවක්ම අතීතය විසින් උදුරගත්තා. දෙමව්පියන්ගේ හිත් රිදවන්න එපා කියලා එදා මගේ හිත මට බල කළා. අපිට වෙන්වෙන්න සිද්ධ වුණේ ඒ හින්දා. ඔයා වැරදි නෑ කියලා මම දන්නවා. එදත් මම ඔයාගෙන් සමාව ඉල්ලුවා. අදත් මම ඔයාගෙන් සමාව ඉල්ලනවා පියරත්න. සිරිපාලව කසාද බැන්දේ දෙමව්පියන්ගේ හිත් රිදවන්න බැරිකමට කියලත් ඔයා දන්නවා.."

"ඒ කාලේ මම ඔයාට කොච්චර ආදරේ කළාද යසෝ."

"මම ඉතින් නොදන්නවයැ"

"ඉස්කෝලේදී අර යසපාලයා ඔයාට කොලොප්පමක් කරලා මම උඌට බිම දාගෙන හොඳටම තඩිබෑවා. උගේ යාළුවොත් එක්ක ගහමරා ගත්තා. ලොකු ඉස්කෝලේ මහත්තයා මට හොඳටෝම ගැහැව්වා. ඔයා පන්තියේ ඩෙස් එකට ඔළුව ගහගෙන හොඳටෝම ඇඬුවා. ඔයාට මතකද යසෝ..."

"මම ගෙදරින් හොරෙන් තෙල් අරගෙන ඇවිල්ලා පන්ති කාමරේ කවුරුත් නැති වෙලාවේ අඩ අඬා අතපයවල තෙල් ගෑවා. ඔයාට මතකද පියරත්න. බලාපොරොත්තු පොදිගහගෙන අපි අපේම වෙලා හිටය කාලයක් එදා අපිට තිබුණා. අන්තිමට ඉතිරි වුණේ දුක්බර මතකයක් විතරයි."

sinhalaebooks.com

**"ඉස්කෝලේ බිත්ති පුරාම අපි දෙන්නගේ නම් බොහෝම අපූරුවට ප්‍රසිද්ධ වෙලා තිබුණා. යාළුවෝ ඔයාට විහිලු කරනවා. 'ආ.... පියරත්න එක්ක යාළුයි නේද කියලා.' ඔයාගේ මුහුණ ජම්බු ගෙඩියක් වගේ රතුවෙනවා එතකොට. මම හිනාවෙවී බලාගෙන ඉන්නවා ඔයා දිහා. යසෝ උන්ව එළවාගෙන යනවා. මම හයියෙන් හිනාවෙනවා. ඔයා මං ළඟට ඇවිල්ල මගේ මුහුණ දිහා බලාගෙන හොඳටම අඬනවා. පුංචි දරුවෙක් වගේ..."**

**"අමතක කරන්න බැරි අතීතයක් එදා අපිට තිබුණා. ඒත් කාලයේ වේගයෙන් ඒ මතක සටහන් ගොඩක් ඈතට විසිරිලා ගිහිල්ලා. අපි දැන් වයසයි. අත පය වාරු නෑ. වැඩක් පලක් තනියෙන් කරගන්න බෑ. කාගේ හරි උදව් ඕනා. තව ටික දොහාකින් අපි මැරිලා යයි. එතකොට ඒ හැම මතකයක්ම අපේ අනිත්ම හුස්ම පොදක් එක්ක පිටවෙලා ඈත්තටම යයි. පියරත්න පෝලිම අඩුවෙලා. යමු ඇතුළට."**

ඔහු අත්වාරුවට බර දෙමින් නැගිට හෙමින් හෙමින් කන්තෝරුව ඇතුළට ගොස් පැන්ෂන් පඩි ගත්තේය. යසෝමා දෙවනුව පැන්ෂන් පඩි ගත්තාය.

**"අපි ඉස්කෝලේ ළඟ කඩෙන් තේ කහට එකක් බීලම යමුද... එදා වගේ.."**

**"විකාර"**

sinhalaebooks.com

**“පෙර කරන ලද අකුසල කර්මයක් නිසා දෙමව්පියන්ට අපිව තේරුම් ගන්න බැරි වුණා. අපිට වෙන්වෙන්න සිද්ධ වුණා. ඒ වුණාට මම තාමත් ආදරෙයි යසෝ මැණිකේ.”**

**“මම වෙනස් වෙලා කියලා ඔයාට හිතෙනවද පියරත්න. ගතින් වෙන් වුණාට හිතින් මං කවදාවත් ඔයාගෙන් ඈත්වෙලා නෑ. ඒක ඔයා දන්නවා. මටත් වඩා.”**

එහෙම කියද්දී ඇයගේ දෑස්වලට කඳුළු එකතු වුණා ඇයටත් නොදැනීම.

**“යසෝ ඔයා අඬනවා.”**

දෙකම්මුල් දිගේ බේරෙන කඳුළු පියරත්නගෙන් වසන් කරන්න බැරි බව ඇය දැන සිටියාය.

**“අතීතය අමතක කරන්න බැරි වුණාම ඇස්වලට කඳුළු පිරෙනවා.”**

**“මම දන්නවා ඔයා මට ආදරෙයි කියලා.”**

**“අපි ගෙදර යමු පියරත්න. මට ඔයාව බලාගන්න පුළුවන්.”**

යසෝමා ඉකිබිඳිමින් කීවාය.

**“ඔයාගේ අතපය වාරු නෑ මාත් එක්ක ඔට්ටු වෙන්න.”**

**“කමක් නෑ. අපි ගෙදර යමු.”**

sinhalaebooks.com

යසෝ්මා පියරත්නගේ දෑත් තරයේ අල්ලා ගත්තාය.

**"යමු..."**

ඔවුන් දෙදෙනා නිවස බලා පිටත් වූහ. නිවස ඉදිරිපිට නවතා ඇති සුඛෝපභෝගී මෝටර් රථය දුටු යසෝමා සිතුවේ ඇය කැඳවාගෙන යෑම සඳහා සරණපාල පැමිණ ඇති බවකි. එසේ වුවහොත් පියරත්නට මහළු නිවාසය කරා යෑමට සිදුවනු ඇතැයි ඇය සිතුවාය. නමුත් එහි පැමිණ සිටියේ නාදුනන කිහිපදෙනෙකි.

**"මේ සරණපාලගේ අම්මා වෙන්නැති."**

**"ඔව් පුතේ..."**

**"අම්මේ....! සරණපාල අපිට මේ ගේයි ඉඩමයි වික්කා. අපි ආවේ අම්මට ඒ බව දන්වන්න.."**

**"මොනවා...සරණපාල ඉඩම විකුණලා."**

යසෝමා අසරණ වූවාය. කිසිත් සිතා ගැනීමට නොහැකි වූ තැන ඇය කල්පනා කළේ සරණපාල සහ ලේලිය තමාව රවටා ඇති බවය. ඇයගේ දෑස් කඳුළින්

sinhalaebooks.com

බර විය. දෑස් අගින් ගිලිහී ආ කඳුළු දෙකම්මුල් තෙමන්නට වූවාය. අවපැහැ ගැන්වී ගිය ඔසරි පොටෙන් කඳුළු පිසදාගත් යසෝමා පියරත්න දෙස බැලුවාය.

“අපි මහළු නිවාසෙට යමු. මේ ටික කාලේ ජීවත් වෙන්න එතැන ඉඩතියෙයි යසෝ..” ඇයගේ හිස පිරිමදිමින් පියරත්න යසෝමා වැලඳ ගත්තේය.